# බටහිරයන් එන්නේ මොකාට ද?

පසුගිය දිනවල බටහිර රටවල රාජ්‍යතාන්ත්‍රිකයන් නමින් හැඳින්වෙන්නෝ බොහෝ දෙනෙක් ලංකාවට පැමිණියහ. ඔවුන් පැමිණියේ දළදාවහන්සේ වැඳගැනීමට නොවන බව කවුරුත් දනිති. එහෙත් අද බටහිරයෝ එදා මෙන් දළදාවහන්සේට හානිකිරීමට ද ඉදිරිපත් නො වෙති. අපේ හාමුදුරුවරුන්ට සුද්දන්ගෙන් දළදාවහන්සේ රැකගැනීම සඳහා තැනින් තැනට වැඩමකරවීමට සිදු වූ බව එතරම් ඈත නොවන ඉතිගාසයෙහි සඳහන් වෙයි. දළදාවහන්සේට හානි නොකර සිංහල බෞද්ධයන්ට වින කරන්නේ කෙසේදැයි එදා මෙදා තුර බටහිරයන් අධ්‍යයනය කර ඇත. පසුගිය අවුරුදු තිහක පමණ කාලයක ශ්‍රී මහා බෝධීන්වහන්සේට ද දළදා වහන්සේට ද හානි කළෝ බටහිරයන් වෙනුවෙන් ක්‍රියාකරන කොටි ත්‍රස්තවාදීහු ය. ඒ හැරෙන්නට අධ්‍යාපනය, ජනමාධ්‍ය ඔස්සේ සිංහල බෞද්ධයනට හා සිංහල බෞද්ධ සංස්කෘතියට වින කරන්නේ කෙසේ දැයි බටහිරයෝ දනිති.

පසුගිය සතියට පළමුව බටහිරයන් අපට කීවේ කුමක් ද? ලියම් ෆොක්ස් මුල්වරට ලංකාවට පැමිණියේ ජී එල් පීරිස් එ ජා පක්ෂයේ ප්‍රධානියකු ලෙස බ්‍රිතාන්‍යයන්ට අවශ්‍ය ආකාරයට කූට මණ්ඩල (එපෙක්ස් බොඩි) සකස්කරමින් සිටි අවධියෙහි ය. රනිල් වික්‍රමසිංහ හා චන්ද්‍රිකා කුමාරතුංග අතර කොටි හිතවාදී ගිවිසුම් ෆොක්ස් අත්සන් කෙරෙව්වේ ලංකා හෙවත් ඇංග්ලිකන් පල්ලියේ ආශිර්වාදය හා අනුග්‍රහය යටතේ ය. ෆොක්ස්ලා ඉතා කපටි ලෙස එදා ක්‍රියා කෙළේ සහසන්ධිය රාජ්‍යයක් බිහිකිරීමට ය. ඔවුන්ට අවශ්‍ය වූයේ ඊනියා සටන්විරාම ඇතිකිරීමට හා ආණ්ඩුව කොටි සමග සාකච්ඡාකිරීමට ය. ඔවුන් ප්‍රශ්නය ලෙස දුටුවේ සිංහලයන් දෙමළ ජනයාට කරන ඊනියා අසාධාරණකම් ය. ඔවුහු සහසන්ධීය රාජ්‍යය ඇතිකිරීම සඳහා බොරු ඉතිහාසයක් ද ගෙතූහ.

ඇතැම් සිංහලයන් සිතන්නේ බටහිරයන් දෙමළ ජාතිවාදීන්ගේ ප්‍රචාරවලට මුළා වී ඒ බොරු ඉතිහාසය හා ඊනියා අසාධාරණකම් විශ්වාස කරන බව ය. එහෙත් ඒ ප්‍රචාර කරන්නේ එයට අනුග්‍රහය දක්වන්නේ අවශ්‍ය මාධ්‍ය පහසුකම් සපයන්නේ බටහිරයන් බව ඔවුහු නො දනිති. ඔවුන්ට අනුව අප බටහිරයන්ට කරුණු කියා දුනහොත් බටහිරයන් දෙමළ ත්‍රස්තවාදීන්ට විරුද්ධ වනු ඇත. ඉතා කාර්යක්ෂම ඔත්තු සේවා ඇති බටහිරයන්ට අප අමුතුවෙන් ඉගැන්විය යුතු නො වේ. බටහිරයෝ සිංහල බෞද්ධයනට එරෙහිව දැනුවත්ව දෙමළ ජාතිවාදීන් යොදාගනිති. බටහිරයන්ට කරුණු කියා දීමට ගොස් අප කාලය කා දැමිය යුතු නො වෙයි. ඔවුන්ට කරුණු කීම හොරට නිදාගෙන සිටින්නන් අවදිකිරීමට උත්සාහකිරීමක් වැනි ය. අප ලබා ඇති බටහිර අධ්‍යාපනය හේතුවෙන් මේ සියල්ලෙහි මුල බටහිරයන් බව සිතීමට පවා අපට නො හැකි ය. කොටින්ට සබ්මැරීන, ගුවන්යානා, නවීන ආයුධ හා පුහුණුව ද ලබාදුන් බටහිරයන් කෙරෙහි අප තවමත් විශ්වාසය තබන්නේ නම් එයට හේතුව අපට අධ්‍යාපනයෙන් ලැබී ඇති දීනකම ය.

ෆොක්ස් වැන්නන් මේ අවසන් මොහොතේ දී ලංකාවට පැමිණියේ ඊනියා මිනිස් පළිහක් ලෙස රඳවා ගෙන ඇති ජනයා මුදාහැරීමට අවස්ථාව සපයන ලෙස ආණ්ඩුවට කීමට ය. අනෙක් පැත්තෙන් ඔවුන්ට අවශ්‍ය වූයේ රඳවාගෙන ඇති ජනයා දඩමීමා කරගනිමින් ලංකාණ්ඩුවට බලපෑම් දැමීමට ය. බටහිරයෝ ලංකාණ්ඩුවට මෙන් අහිංසක දෙමළ ජනයා වෙනුවෙන් කොටින්ට බල නො කළහ. බටහිරයන්ට අවශ්‍යවූයේ ප්‍රභාකරන් සමග සටන් විරාමයක් ඇතිකිරීමට හා ප්‍රභාකරන් සමග කතා ඇරඹීමට ආණ්ඩුවට බලපෑම් දැමීමට ය. යුරෝපා සංගමය මේ සිවිල් වැසියන් ගැන සොයා බැලීමට යැයි කියමින් නියෝජිත පිරිසක් එවීමට ඉල්ලීමක් කෙළේ ය. ආණ්ඩුව ඒ ඉල්ලීමට ඉඩ නොදීමට තීරණය කෙළේ ය. ඒ අතර එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් සංවිධානයේ අධ්‍යක්ෂකවරියක ලෙස පත් වූ පිල්ලේ නමැත්තියක් ආණ්ඩුවේ හමුදා අහිංසක සිවිල් වැසියන් දහස් ගණනක් මරා දමා ඇති බව කියමින් විශාල කලබැගෑනියක් කිරීමට උත්සාහ ගත්තා ය. එක්සත් ජාතීන්ගේ සංවිධානවල නියෝජිතයන් හා ඔවුන්ගේ පවුල්වල උදවිය කොටි විසින් පැහැරගනු ලැබ ඇති බවට වාර්තා වූයේ ඒ අතර ය.

බටහිරයන් මේ සූදානම්වන්නේ කුමකට ද යන්න ඉතා පැහැදිලි ය. ඔවුන්ට අරමුණු දෙකක් වෙයි. මිනිස් පළිහේ දැනට සිටින්නන් සංඛ්‍යාව අති විශාල විය නො හැකි ය. ඒ පනස්දහසකට අඩුවිය යුතු ය. ඔවුන්ගෙන් ඇතැමුන් අහිංසක ජනයා විය හැකි අතර තවත් අය කොටි හිතවාදීන් විය යුතු ය. අහිංසක ජනයා රඳවා ගැනීමේ දී කොටි හිතවාදීන් යම් කාර්යභාරයක් කරනු නිසැක ය. කොටි හිතවාදීන් තමන් ද අහිංසකයන් බව පෙන්වීමට කටයුතු කරන බව ද

පැහැදිලි විය යුතු ය. කොටි මේ ඊනියා මිනිස් පළිහෙන් බලාපොරොත්තුවන්නේ ආණ්ඩුව අහිංසක ජනයා මරා දමන්නේ යැයි කියමින් බටහිරයන් ලවා මෙරටට හමුදා එවීම ය. ඊනියා පැහැරගැනීම් කෙරෙන්නේ ද ඒ අරමුණෙන් ය. බටහිරයන්ගේ පළමුවැනි අරමුන ද යම්කිසි කරුණක් දඩමීමා කරගෙන මෙරටට ඔවුන්ගේ හමුදා එවීම ය. ආණ්ඩුව ඒ සඳහා කිසිම ඉඩක් නොදිය යුතු ය. බටහිරයන්ගේ ඊනියා නියෝජිත කණ්ඩායම්වලට මෙරටට ඇතුල්වීමට අවසර නොදිය යුතු ය.

අනෙක් අතට ආණ්ඩුවේ කාර්යභාරය ඊනියා සිවිල් වැසියන් ගලවාගැනීම නොව කොටි සමූලඝාතනය කිරීම ය. ආණ්ඩුව ඒ බව බටහිරයන්ට ඉතා පැහැදිලිව කිවයුතු ය. කොටි සමූලඝාතනය කරන අතර ඊනියා සිවිල් වැසියන් ද බේරාගැනීමට හැකිනම් යහපත් වෙයි. එහෙත් හමුදාවල ප්‍රමුඛතාව දිය යුත්තේ ඊනියා සිවිල් වැසියන් බේරාගැනීමට නො වේ. හමුදාව සටන් කරන්නේ ත්‍රස්තවාදය සමූලඝාතනය කිරීමට හා ඒකීය (එක්සේසත්) රාජ්‍යය රැකගැනීමට ය. මෙහි දී මානව හිමිකම් අයිතිකරුවන් ලෙස කටයුතු කරන බටහිර ගැති ටාජ්‍ය නොවන එහලුන් ගේ කිඹුල් කඳුළුවලට ආණ්ඩුව රැවටිය යුතු නො වේ. මේ කඳුළු හෙලන්නේ මළගෙවල්වල කුලියට අඬන ගැහැණුන් මෙන් බව මේ වන විට ආණ්ඩුවට වැටහීමක් තිබිය යුතු ය. ඒ ගැහැණුන්ට මෙන් ම මානව හිමිකම් අයිතිකරුවන්ට ද හැඬීමෙන් පසුව කුලිය ලැබෙයි. මේ මානව හිමිකම් අයිතිකරුවන් කිසිවකු කොටි සිවිල් ජනයා මරා දමන විට කිසිවක් නොදුටුවන් සේ කටයුතු කරති. එවැනි අවස්ථාවල ඔවුන්ගේ ඇස් කඳුළින් පිරී ඇති බැවින් කොටි ඝාතන ඔවුන්ට නොපෙනෙනවා විය හැකි ය. ගුවන්යානයක් පැහැරගත්විට ඒ ඒ ආණ්ඩු ක්‍රියාකරන්නේ මගීන් ගළවාගැනීමට නොව කොල්ලකරුවන් අල්ලාගෙන දඩුවම් කිරීමට ය. මගීන් බේරාගැනීමට ආණ්ඩු ක්‍රියාකරන්නේ නම් කළ යුත්තේ කොල්ලකරුවන්ගේ ඉල්ලීම්වලට එකඟ වීම ය. එහෙත් ආණ්ඩු එසේ ක්‍රියා නොකරයි. කොල්ලකරුවන් අල්ලාගැනීමේ දී මගීන් ද බේරාගත හැකිනම් ඒ යහපත් වෙයි. එහෙත් එසේ කළ නොහැකි නම් කිසිම ආණ්ඩුවක් මානව හිමිකම් අයිතිකරුවන්ගේ කඳුළු පිසදැමීමට ක්‍රියා නොකරයි.

බටහිරයන්ගේ දෙවැනි අරමුණ මේ සියල්ල මැද දෙමළ ජාතිවාදීන්ගේ ඉල්ලීම්වලට (එනම් බටහිරයන්ගේ ද ඉල්ලිම්වලට) ආණ්ඩුව එකඟකරවා ගැනීම ය. අද ෆොක්ස් කිසිම ලජ්ජාවකින් තොරව කොටි පරාජය වී ඇති බව කියයි. බටහිරයන් කොටින්ගේ අනභිබවනීයත්වය ගැන කියා එතරම් කල්ගත වී නැත. එහෙත් අද බටහිරයන්ට ද කොටි පරාද වී ඇති බව පිළිගැනීමට සිදුවී  ඇත. ඔවුන් දැන් වෑයම් කරන්නේ ඉන්දියාව සමග එකතු වී බලය විමද්‍යගත කිරීමට ආණ්ඩුවට බලපෑම් දැමීමට ය. ෆොක්ස්ලා ලංකාවට එන්නේ ඊනියා සිවිල් වැසියන් ආරක්ෂාකිරීමේ මුවාවෙන් මෙරටට එක්සත් ජාතීන්ගේ හමුදා එවීමට පොටක් පාදාගැනීමට ය. එසේත් නැතහොත් ඒ බැරිවුවහොත් බලය බෙදීමට ආණ්ඩුවට බලකිරීමට ය.

එහි දී ඔවුන් රටේ ආර්ථික තත්වය ද ප්‍රයෝජනයට ගනු ඇත. ආණ්ඩුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් හෝ වෙනත් ආයතනයකින් හෝ ණයක් බලාපොරොත්තුවන විට බටහිරයන් බලය බෙදීමේ කොන්දේසි පැනවීමට ඉඩ ඇත. දහතුන්වැනි ව්‍යවස්ථා සංශෝධනයෙන් දැනට ක්‍රියාත්මක වන වගන්ති හැරෙන්නට වෙනත් එකදු වගන්තියක්වත් ක්‍රියාත්මක කිරීම අනවශ්‍ය වෙයි. ඉඩම් බලතල හා පොලිස් බලතල අවශ්‍ය නොවන බව අද වන විට කරුණා අම්මාන් ඇමතිවරයා ද පිළිගෙන ඇත. ඉන්දියාව අප මත බලෙන් පැටවූ මේ කොන්දේසි දෙමළ ජනයාට වුව ද අවශ්‍ය නොවේ. ඉදිරියේ දී කරුණා අම්මාන් ඇමතිවරයාට අමතරව වෙනත් දෙමළ නායකයන් ද ඒ බව පිළිගනු ඇත. ඊනියා බලය බෙදීමක් අවශ්‍ය වන්නේ සිංහල බෞද්ධ විරෝධීන් වූ බටහිරයන්ට, දෙමළ ජාතිවාදීන්ට, ඇතැම් දෙමළ දේශපාලන පක්ෂවලට, කසිකබල් මාක්ස්වාදීන්ට, ව්‍යාජ ලිබරල්වාදීන්ට, මානව හිමිකම් අයිතිකාර කුළීකරුවන්ට  හා පල්ලියට ය. දෙමළ ජනයාට අවශ්‍ය වන්නේ ඊනියා බලය බෙදීමක් නොව කිසියම් ආකාරයක සංවර්ධනයකි. අද එය බටහිර මාදිලියේ සංවර්ධනයක් වී ඇත. පසු දිනෙක ඒ ජාතික සංවර්ධනයක් වනු ඇත. ජාතික සංවර්ධනයක ජාතික පරිපාලනයක් ද තිබිය යුතු ය. කෝල්බෲක් කැමරන් ද්‍රෝහි යෝජනාවල (මේවාට ප්‍රතිසංස්කරණ යැයි කීමට අපට ඉගැන්වූවෝ බ්‍රිතානිහු ය.) ප්‍රතිඵලයක් ලෙස අපට ලැබී ඇති පරිපාලනය යටතේ බලය ඇත්තේ ලිපිගොනුවල හා කඩදාසිවල ය. අපට අවශ්‍ය පරිපාලනයක් හා සංවර්ධනයක් සකස් කරගෙන බටහිරයන් හා දෙමළ ජාතිවාදය පරාජය කළ යුතු ය. ලිපිගොනු හා කඩදාසිවලින් කෙරෙන බලය බෙදීම් හෝ වෙනත් බලය බෙදීම් හෝ අවශ්‍ය නො වේ.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva